**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 09/2015 (1)**

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාළිගාවත්ත,
කොළඹ 10.
2016.02.8

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාධිපති වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>සංශෝධිත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා ගෙවීම් ආරම්භ කිරීම</u>**

මවිසින් 2015.09.14 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/2015 ට අමතරව වශයෙනි.

එම චක්‍රලේඛයේ සඳහන් 04 වන ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු අතර ඒ අනුව ආයතන මඟින් එවනු ලබන PD 06 සංශෝධන අයදුම්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අනුමත කල පසු එම අයදුම්පත් වලට අනුකූලව **අදාළ ආයතන විසින් සංශෝධන භාණ්ඩාගාර 79 නිකුත් කල යුතුය.**

එම සංශෝධන භාණ්ඩාගාර 79 හි විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිටපත කඩිනමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට එවිය යුතුය. එය ලැබුනු පසු පමණක් සංශෝධිත පාරිතෝෂිකය හා සංශෝධිත විශ්‍රාම වැටුප සෘජුවම විශ්‍රාමිකයාගේ ගිණුමට බැර කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. එම ගෙවීම් කටයුතු පහසු කිරීම සඳහා ආයතන ප්‍රධානීන් පහත පරිදි ක්‍රියා කල යුතුය.

1. සංශෝධිත ප්‍රදානය නිකුත් කිරීමේ දී අදාළ නිළධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය අනිවාර්යයෙන් සඳහන් කල යුතුය.
2. **සංශෝධිත විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කල යුතු දිනය** (සංශෝධනයට අදාළ චක්‍රලේඛය අනුව) ප්‍රදාන පත්‍රයෙහි වෙනම සඳහන් කල යුතුය. (විශ්‍රාම ගන්නා දිනයට ඉදිරියෙන් වරහන් තුළ)
3. නිකුත් කරනු ලබන ප්‍රදානයේ සංශෝධන ප්‍රදානයක් බවත් නිකුත් කරන දිනයත් පැහැදිලිව සඳහන් කල යුතුය. (1 වෙනි සංශෝධනය 2016.01.01)
4. දැනට බැංකු ගිණුමක් නොමැති විශ්‍රාමිකයින් සම්බන්ධව පහත පරිදි කටයුතු කල යුතුය. එනම් මෙම සංශෝධිත විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සෘජුවම බැංකු ගිණුම් වලට බැරකරන බැවින් විශ්‍රාමිකයින්ගේ නමට ඇති තනි පුද්ගල බැංකු ගිණුමක ඡායා පිටපත් මෙම ප්‍රදාන පත්‍රය සමඟ අපවෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

එස්.එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය
5. විගණකාධිපති - අ.ක.ස.